(1) පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

i) මෙම කෙටි කතාවේ රචකයා කවුරුන් ද?
ii) එය අයත් කෙටි කතා සංග්‍රහයේ නම සඳහන් කරන්න.
iii) මෙහි රචකයා හඳුන්වන ගෞරවණීය නම ලියා දක්වන්න.
iv) මේ නිර්මාණකරුගේ වෙනත් කෙටි කතා සංග්‍රහ දෙකක නම් ලියන්න.
v) මේ සාහිත්‍යධරයා විසින් රචිත නවකතා මොනවා ද?
vi) ළමා පරපුර වෙනුවෙන් මේ නිර්මාණකරු ලියූ නිර්මාණ මොනවා ද?
vii) සාහිත්‍ය නිර්මාණ සම්බන්ධයෙන් මෙම නිර්මාණකරුට හිමි වූ සම්මාන මොනවා ද?
viii) මෙම කෙටි කතාවේ අනුභූතිය කෙටියෙන් ලියන්න.
ix) මේ කෙටි කතාව ලියා ඇත්තේ කවර කථන ක්‍රමයක් ඇසුරුකරගෙන ද?
x) විසිකිළි භාවිතය ගැන මේ ගම්මු තුළ වූ හැඟීම කෙටියෙන් විස්තර කරන්න.

(2) මෙම ප්‍රකාශ සම්බන්ධයෙන් අවස්ථා සම්බන්ධ ලියා දක්වන්න. (කා විසින් කා හට කුමන අවස්ථාවේ ද යන්න)

i) ''එහෙනම් කුලීකාරයෙක් හොයා ගනින්. මට බෑ කිව්වොත් බෑ'' යි මම සැරවුණෙමි''
ii) ''කවුද මේ ගෙදර ලොක්කා'' මෙවර ඔහුගේ උච්චාරණය ද පෙරට වඩා පැහැදිලි විය.'
iii) සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් හදන්න ඕනෑ. මම ආයිමත් සුමාන දෙකකට පස්සේ එනව.''
iv) ඔව්, පල්ලෙහා තියෙන්නෙ වෙල්යාය ඊට එහායින් තවත් ගම් ගොඩැල්ලක් තියෙනවා.
v) ''ඕක එය තරම් අඩබෙර ගහන්න දෙයක් නෙවෙයි. දන් කවුරුත් කැලෑගානෙ රිංගන්නෙ නෑ''

3) විචාර ප්‍රශ්න

1) i) උපමා භාවිතය
ii) සංකේත භාවිතය නිර්මාණාත්මකව භාවිත කිරීම තුළ මෙම කෙටිකතාව සාර්ථක වී ඇත. පහදන්න.
(එකකට උදාහරණ දෙක බැගින් වචන 125 කි.)

2) නීතිය හා ප්‍රායෝගිකත්වය අතර වූ පරස්පරතාව මේ කෙටිකතාව තුළ සියුම් ලෙස කියාපාන බව විස්තර කරන්න.
(උදාහරණ තුනක් ගෙන වචන 100 ක් භාවිත කළ යුතුය)

3) නව්‍ය තත්ත්වයකට වහා අලුත් පරපුර හැඩගැසෙයි. ඒ පැරන්නන් සම්ප්‍රදාය ඉක්මවා යාමට ඇති අකමැත්තයි. උදාහරණ තුනක් ගෙන විස්තර කරන්න. වචන 100 ක් සෑහේ.